# කතරගම දෙවිඳුන්ට කෙරෙන පුද-පූජාවන්හි පැනෙන අන්තර් සංස්කෘතික සන්නිවේදනය

*නිල්මි, ඩී. ජී. අයි. එස්.* [1]

දෙවියන් ඇදහීම වර්තමාන සමාජයේ විවිධ සමාජ ස්ථරයන්ට හා සංස්කෘතීන්ට ආවේණික අයුරින් සිදු කරන අයුරු දැකගත හැකිය. මිනිසුන්ගේ ඇදහිලි හා විශ්වාස ක්‍රම දුරාතීතයේ සිට පැවත එන්නකි. එය විවිධ සමාජ හා සංස්කෘතික වෙනස් වීම් හමුවේ වෙනස් වෙමින් හා වර්ධනය වෙමින් වර්තමානය දක්වා පවත්වාගෙන එනු ලැබේ. කතරගම දෙවියන් සිංහල සහ ද්‍රවිඩ ජනයාගේ වන්දනයට ලක් වන ආකාරය දැකගත හැකිය. එසේ වීමට පාදක වන හේතුව කුමක්ද? එය කෙසේ ඇති වූවක්ද? තොරතුරු ලබා ගැනීම සඳහා නිරීක්ෂණ ක්‍රමවේදය සම්මුඛ සාකච්ඡා ක්‍රමවේදය භාවිතා කෙරෙයි. දත්ත විශ්ලේෂණයේදී සංසන්දනාත්මක සහ විග්‍රහාත්මක දත්ත විශ්ලේෂණය යන ක්‍රම දෙකම භාවිතයට ගනු ලැබිණි. කතරගම දෙවියන්ගේ ප්‍රභවය පිළිබඳ විවිධ සංස්කෘතීන්වල පවතින මතවාද සහ කතරගම දෙවියන් උදෙසා විවිධ සංස්කෘතීන්වලට අයත් පිරිස් මගින් පවත්වනු ලබන පුද-පූජාවන්හි පවතින අන්තර් සංස්කෘතික ලක්ෂණ පිළිබඳවත්, එහිදී සිදුවී ඇති අන්තර් සංස්කෘතික සන්නිවේදනය පිළිබඳ අධ්‍යයනය කිරීමත් ප්‍රධාන අරමුණු වේ.

**ප්‍රමුඛ පදඃ** කතරගම දෙවියන්, අන්තර් සංස්කෘතික සන්නිවේදනය, සංස්කෘතිය

[1] *ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර, ජන සන්නිවේදන අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*nilmi2014@gmail.com*